# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1981 අංක 58 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 09 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

—1981 සැප්තැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි.  තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1981 අංක 58 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 5/80.

## 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 58 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ 6 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, එහි 6අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 1979 අංක 7 දරන පනතෙහි 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නෙරපීම සඳහා වූ ඉල්ලීම් ඇතැම් කාල සීමා ඇතුළත විභාග කොට අවසන් කළ යුතු බව.

6අ. 5 වන වගන්තිය යටතේ කරන ලද සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීමේ දින සිට, ලින් මාස දෙකක කාල සීමාවක් ඇතුළත, අවසාන වශයෙන් විභාගකොට, අවසන් කරනු ලැබිය යුතු අතර, එවැනි යම් ඉල්ලීමක් ප්‍රකාර, 7 වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ ආඥාවක්, එම ආඥාවේ සඳහන් ඉඩමෙන් යම් තැනැත්තකු නෙරපිය යුතු බවට විධාන කරමින් අධිකරණයක් විසින් කරනු ලබන අවස්ථාවක, නෙරපීම සඳහා වූ ඉල්ලීමේ දින සිට, මාස තුනක කාල සීමාවක් ඇතුළත, ඒ තැනැත්තන් එම ඉඩමෙන් නෙරපන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ඒ සියලු ආඥා, අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 11 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, එහි 11අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියෙහි 11අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නෙරපීමෙන් පසු ඉඩමකට නැවත ඇතුල්වීම වරදක් විය යුතු බව.

11අ. (1) 7 වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් ක්‍රියාවේ යෙදවීමෙන් යම් ඉඩමකින් තමාව නෙරපනු ලැබීමෙන් අවුරුදු 10 ක කාල සීමාවක් ඇතුළත, වලංගු බල පත්‍රයක් යටතේ හෝ යම් ලිඛිත නීතියකට අනුකූලව ප්‍රදානය කරන ලද රජයේ වෙනත් ලිඛිත අධිකාරයක් යටතේ හැර, ඒ ඉඩමට ඇතුල්වන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසක් දක්වා දීර්ඝ විය හැකි දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ඒ 57178—15,600 (81/06)

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව යම් නඩු කටයුත්තක් පවරනු ලැබූ විට, වරද කරන ලදැයි කියනු ලබන්නේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද, ඒ ඉඩමෙන් ඒ තැනැත්තා නෙරපනු ලැබුවේ 7 වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ වූ ආඥාවක් ක්‍රියාවේ යෙදවීමෙන් බව ඔප්පු කිරීම මත, මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ නඩු කට යුතු අවසානයට පත්වන තෙක්, ඒ තැනැත්තා සහ ඔහුගෙන් යැපෙන්නන් වෙතොත්, ඔවුන් ද, ඒ ඉඩමෙන් නොපමාව නෙරපනු ලැබිය යුතු යයි ආඥා කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් යළි අංක කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(2) 3 වන වගන්තියෙන් නියම බලධරයකු වෙත පවරනු ලැබූ යම් බලයක්—

(අ) රාජ්‍යාරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව හැර, ශ්‍රී ලංකා යුද හමුදාව හෝ ශ්‍රී ලංකා නාවුක හමුදාව හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත සතු කරන ලද හෝ ඒවාට අයිති නැතහොත් ඒවායේ පාලනයට යටත් යම් ඉඩමක් සම්බන්ධයෙන්;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව හැර, ඒ අධිකාරිය වෙත සතු කරන ලද හෝ ඊට අයිති නැතහොත් එහි පාලනයට යටත් යම් ඉඩමක් සම්බන්ධයෙන්;

(ඇ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව හැර, ඒ අධිකාරිය වෙත සතු කරන ලද හෝ ඊට අයිති නැතහොත් එහි පාලනයට යටත් යම් ඉඩමක් සම්බන්ධයෙන්

ඒ නියම බලධරයා විසින් ක්‍රියාත්මක කරනු නො ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "නියම බලධරයා" යන අර්ථ කථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"නියම බලධරයා" යන්නෙන්, එය යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා, අතිරේක දිසාපතිවරයකු හෝ උප දිසාපතිවරයකු හෝ අදහස් වන අතර,—

(අ) ඒ ඉඩම යුද්ධ හමුදාවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, යුද්ධ හමුදාවේ හමුදාධිපතිවරයා ද ;

(ආ) ඒ ඉඩම ශ්‍රී ලංකා නාවික හමුදාවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික හමුදාධිපතිවරයා ද ;

(ඇ) ඒ ඉඩම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හමුදාධිපතිවරයා ද ;

(ඈ) ඒ ඉඩම දුම්රිය දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා ද ;

(ඉ) ඒ ඉඩම ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ජාතික නිවාස කොමසාරිස්වරයා ද ;

(ඊ) ඒ ඉඩම පළාත් පාලන ආයතනයක පාලනය යටතේ පවත්නා අවස්ථාවක, පළාත් පාලන කොමසාරිස්වරයා ද ;

(උ) මේ පනතේ යම් කාරණාවක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන්, දිසාපතිවරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයෙක් ද ; සහ

(ඌ) ඒ ඉඩම සංස්ථාගත මණ්ඩලයක් වෙත සතු කරනු ලැබූ හෝ සංස්ථාගත මණ්ඩලයකට අයත් වූ හෝ සංස්ථාගත මණ්ඩලයක පාලනය යටතේ පවත්නා හෝ අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලය විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ නිලධරයෙක් ද

එයට ඇතුළත් වෙති.' ;

(2) "රජයේ ඉඩම්" යන අර්ථ කථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"රජයේ ඉඩම්" යන්නෙන්, නීත්‍යානුකූලව රජයට හිමිකම ඇත්තා වූ හෝ සහබද්ධ හෝ අනුබද්ධ සියලු අයිතිවාසිකම්, සම්බන්ධතා සහ වරප්‍රසාද සමග රජය විසින්

බැහැර කරනු ලැබිය හැක්කා වූ හෝ ඉඩමෙහි පිහිටි යම්
ගොඩනැගිල්ලක් සමග ඒ ඉඩම් අදහස් වන අතර,—

(අ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය සහ මහවැලි සංවර්
ධන මණ්ඩලය හෝ රජයේ ඉඩම් සංවර්ධන
කිරීමේ කාර්ය භාරය පැවරී ඇති වෙන යම් අධි
යක් හෝ යම් පළාත් පාලන ආයතනයක් හෝ
වෙත සතු කරන ලද්දා වූ හෝ ඒවායේ පාලනය
යටතේ ඇත්තා වූ ඉඩම් ; සහ

(ආ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම්
ප්‍රතිසංස්කරණ පනතින් පිහිටුවන ලද ඉඩම්
ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ;

(ii) අවස්ථාවෝචිත පරිදි, (439 වන අධිකාරය වූ
රබර් පර්යේෂණ ආඥාපනත, 1958 අංක 4 දරන
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත, 197
අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා
පනත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14
දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත, ජාතික
රාජ්‍ය සභාවේ 1975 අංක 30 දරන පට හා ආශ්‍රිත
නිෂ්පාදන සංවර්ධන පනත, ජාතික රාජ්‍ය
සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු
සංවර්ධන පනත, 1978 අංක 41 දරන නාගරික
සංවර්ධන අධිකාරිය පනත හෝ 1979 අංක 51
දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය
පනත මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද
යම් සංස්ථාවක් වෙත සතු කරන ලද්දා වූ හෝ
එයට අයත් වූ හෝ එහි පාලනය යටතේ
ඇත්තා වූ හෝ ඉඩම්

ඇතුළත වේ.'.

උපලේඛනය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයෙහි "ඇ" ආකෘතියෙහි "සිද්ධි ප්‍රකාශක විසින් 197 ක්වූ මස වන මෙදින මා ඉදිරිපිට දී ප්‍රතිඥා දෙන/දිවුරන ලදී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සිද්ධි ප්‍රකාශක විසින් 19 ක්වූ මස වන දින වූ මෙදින .........දී මා ඉදිරිපිට ප්‍රතිඥා දෙන/දිවුරන ලදී." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්, ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.